# වර්තමාන භික්ෂුව ආගමික වත් පිළිවෙත් වලින් දුරස් වීම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

# An Investigative Study of Contemporary Monks' Departure from Religious Rituals

පනාමුරේ චන්දිම හිමි[1]

අනාදිමත් කාලයක සිට භික්ෂූන් වහන්සේලා ආගමික සමාජයට නායකත්වය දෙමින් ක්‍රියා කළහ. ප්‍රදේශයේ නායකයා වූයේ ද උගතාවූයේ ද භික්ෂූන් වහන්සේය. එහෙත් වර්තමාන සමාජයේ භික්ෂූන් වහන්සේලාට එම නායකත්වය අහිමි වී ඇතිවා පමණක් නොව ආගමික වත් පිළිවෙත් වලින් ද උන් වහන්සේලා ඈත් වී සිටියි. එසේ ආගමික වත් පිළිවෙත් වලින් භික්ෂූන් වහන්සේලා ඈත් වීමට හේතු මොනවාද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි.

වර්තමාන සමාජයේ සිදුවන ආගමික වත්පිළිවෙත් අතර ආමිස පූජා ප්‍රධාන තැනක් ගනී. ඒ අතර බුද්ධ පූජා, බෝධි පූජා, ධාතු වන්දනා, දේව පූජා, භාණ්ඩ පූජා, ධර්ම දේශනා, කප්රුක් පූජා, අට විසි, පූජා තෙසැත්තෑ ඥාන පූජා ආදිය ප්‍රධාන වෙයි. මෙම පූජාවන් වලින් භික්ෂූන් වහන්සේලා බොහෝ විට ඉවත් වී ක්‍රියා කරන ආකාරය දැකිය හැකිය. ඇතැම් විට උදේ හවස  බුදුන් වැඳීම වත් පිරිත් දේශනා පැවැත්වීම, ප්‍රත්‍යවේක්ෂා කිරීම ආදියෙන් පවා භික්ෂූන් වහන්සේලා ඉවත් වී ක්‍රියා කරන ආකාරය දැකිය හැකිය. වර්තමානයේ බොහෝ ආගමික වත් පිළිවෙත් ගිහියන් විසින් මෙහෙය වන ආකාරය දැකිය හැකිය.

භික්ෂුව යනුවෙන් ව්‍යවහාර කරනු ලබන්නේ මානසික පරිවර්තනයක් සහිතව මනාව සංවර වූ ඉන්ද්‍රියයන් සහිතව ආධ්‍යාත්මික හා බාහිර සංවරයෙන් යුතු පිරිසකි. ආගමික වත් පිළිවෙත් සිදු කිරීම භික්ෂුවගේ වගකීම හා යුතුකමයි. එම ක්‍රියාවලින් භික්ෂූන් වහන්සේලා ඉවත්වීම පිළිබඳ ගැඹුරින් සාකච්ඡා කළ යුතුය.

ප්‍රමුඛ පදඃ    භික්ෂූව, වත්පිළිවෙත්, ආගමික, දුරස්වීම, පුදපූජා, සමාජය

1 තාවකාලික කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර .0718026869
chandimapanamure@gmail.com